මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය
Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම් වැඩසටහන - 2020

| පුරවැසි අධ්‍යාපනය | 6 ශ්‍රේණිය | කාලය : පැය 02 යි |
|---|---|---|

**ශිෂ්‍යයාගේ නම :-** ...........................................................................................................................

## I පත්‍රය

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- ප්‍රශ්න අංක 1 සිට 5 දක්වා ප්‍රශ්නවලට ගැලපෙන පිළිතුරු වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.

1. පාසල් සංවිධාන .................................................. යනු පාසලේ පරිපාලන හා සංවර්ධන කටයුතු සකස් වී ඇති ආකාරයයි.
2. අප රටේ පරිපාලන බෙදීම් අනුව කුඩාම පරිපාලන ඒකකය ...................................... කොට්ඨාශයයි.
3. මහනගර සභාවක ප්‍රධානියා ................................................ය.
4. ප්‍රදේශ වාසින්ගේ ........................................ පවුලේ මෙන්ම ප්‍රදේශයේ ද දියුණුවට හේතුවේ .
5. පාසලේ ඉතිහාසය සෙවීමට ......................................... උපයෝගී කරගත හැකිය.

(නගරාධිපති, සාමූහිකත්වය, ව්‍යුහය, ලොග් පොත, ග්‍රාම නිළධාරි , උප්පැන්න සහතිකය)

- අංක 6 සිට 10 දක්වා ප්‍රකාශන හරිනම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද, ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

6. ගුරු ඇගයීම් කටයුතු කිරීම විදුහල්පතිගේ කාර්යයකි. (................)
7. සෑම පුරවැසියෙකුටම අනන්‍යතාවයක් නැත. (................)
8. ඔබගේ දක්ෂතා සමාජයේ දියුණුවට වැදගත් නොවේ . (................)
9. පාසල අනාගතයේ දී ඉටුකර ගැනීමට බලාපොරොත්තු වන අරමුණු මෙහෙවර ප්‍රකාශයෙන් දැක් වේ. (................)
10. ශ්‍රී ලංකාවේ පරිපාලන දිස්ත්‍රික්ක 22ක් ඇත. (................)

- අංක 11 සිට 15 දක්වා ප්‍රකාශවලට ගැලපෙන පිළිතුර තෝරා යා කරන්න.

| ඒ කොටස | බී කොටස |
|---|---|
| 11. ආර්ථික කටයුත්තකි. | රට සංවර්ධනය කිරීම |
| 12. මානව සම්පත පුහුණුවෙන් | භූමිය |
| 13. පංශු සංරක්ෂණ ක්‍රමයකි. | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
| 14. නිවාස ඉදි කිරීමට අවශ්‍ය වේ. | වෙළඳාම |
| 15. රාජ්‍ය ආයතනයකි | වැටි බැඳීම |

- අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට ගැලපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

16. ක්‍රි. ව. 1931 දී ලංකාවේ මුල්ම අධ්‍යාපන අමාත්‍යවරයා වූයේ,

    1. ඩී. එස්. සේනානායක මහතා ය. 2. සී. ඩබ්. ඩබ්. කන්නන්ගර මහතා ය.
    3. ජේ. ආර්. ජයවර්ධන මහතා ය. 4. ඒ. ඊ. ගුණසිංහ මහතා ය.

17. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කිහිපයක් ඒකතු වීමෙන් සෑදෙන්නේ,

    1. ගමකි. 2. පළාතකි. 3. දිස්ත්‍රික්කයකි. 4. නගරයකි.

18. උප්පැන්න සහතිකයක් නිකුත් කරනු ලබන්නේ,

    1. රෝහලෙනි. 2 තැපල් කාර්යාලයෙනි. 3. ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙනි. 4. පාසලෙනි.

19. බෝවන රෝග පාලනය හා සිසුන්ගේ සෞඛ්‍යය පරීක්ෂාව සඳහා අපට සහාය වන්නේ,

    1. විදුහල්පති ය. 2. පොලිස් නිලධාරියා ය. 3. වෛද්‍යවරයා ය. 4. මහජන සෞඛ්‍ය පරීක්ෂවරයා ය.

20. හම්බන්තොට දිස්ත්‍රික්කය අයත් පළාත කුමක්ද?

    1. ඌව පළාත 2. බස්නාහිර පළාත 3. දකුණු පළාත 4. උතුරු පළාත

(ල-2 බැගින් 20=40)

## <u>II පත්‍රය</u>

- **පළමු ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්යය වේ.**
- **තවත් ප්‍රශ්න හතරක් තෝරාගෙන පිළිතුරු සපයන්න.**

01. i. විදුහල්පතිගේ කාර්යයන් 2ක් නම් කරන්න.
    ii. පාසලක අනධ්‍යයන කාර්යය මණ්ඩලයේ කාර්යය 2ක් නම් කරන්න.
    iii. ජීව දත්ත තොරතුරු පත්‍රිකාවකට ඇතුළත් කළ යුතු අංග දෙකක් නම් කරන්න.
    iv. සැලසුම් සහගත ශිෂ්‍යයකුගේ ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.
    v. පාසල් සංස්කෘතියට අයත් සංකේත දෙකක් දක්වන්න.
    vi. පාසල් සංවර්ධන කමිටුවට අයත් වන පුද්ගලයන් දෙදෙනකු නම් කරන්න.
    vii. නැගෙනහිර පළාතට අයත් දිස්ත්‍රික්ක දෙකක් නම් කරන්න.
    viii. පාසල් සිසුවකු වශයෙන් ඔබ සතු අයිතිවාසිකම් දෙකක් නම් කරන්න. (ල-2 බැගින් 8=16)

02. i. පාසල් පාලනය සම්බන්ධ ප්‍රධාන නිලයක් නම් කරන්න.
    ii. පාසල් සිසුවකු වශයෙන් ඔබ සතු විය යුතු හොඳ ගති ලක්ෂණ තුනක් සඳහන් කරන්න.
    iii. වෛද්‍ය සේනක බිබිලේ මහතා පිළිබඳ වාක්‍යය 3ක් ලියන්න.

(ල-2+3+6=11)

03. i. නිදහස් අධ්‍යාපනයේ පියා යනුවෙන් හැඳින්වුයේ කවුරුන් ද?
    ii. මෙතුමාගේ මූලිකත්වයෙන් ආරම්භ කළ පාසලක් නම් කරන්න.
    iii. අධ්‍යාපනය නඟා සිටුවීම සඳහා මෙතුමා ඉටු කළ සේවාවන් 3ක් ලියන්න.

04. i. සැලසුම්කරණය යනු කුමක් ද?
    ii. සැලසුම්කරණය නිසා ඇතිවන වාසි දෙකක් සඳහන් කරන්න.
    iii. සැලසුම් සහගත සිසුවකු තුළ දැකිය හැකි ලක්ෂණ 3ක් ලියන්න.

05. i. පාසලක පවත්නා සම්ප්‍රදායන් 2ක් නම් කරන්න.

ii. පාසල් ලාංඡනය භාවිතා කරනු ලබන අවස්ථා 3ක් නම් කරන්න.

iii. පාසල් ගීතය ගායනා කරන විට ඔබ හැසිරිය යුතු ආකාරය ලියන්න.

06. i. ස්වභාවික සම්පත් 2ක් නම් කරන්න.

ii. භෞතික සම්පත් සංරක්ෂණයට ගත හැකි ක්‍රියාමාර්ග 3ක් නම් කරන්න.

iii. සාමූහිකව කටයුතු කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන 3ක් ලියන්න.

07. i. පළාත් පාලන ආයතන 2ක් නම් කරන්න.

ii. ඔබ ප්‍රදේශයේ ඇති සමාගම් 3ක් නම් කරන්න.

iii. ආගමික සිද්ධස්ථාවලින් ඉටුවන සේවාවන් 3ක් නම් කරන්න.